**බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශය**
**පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය**

# ඇබෑර්තු

**පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම උදෙසා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## සියලුම පුරප්පාඩු සඳහා සපුරාලිය යුතු මූලික සුදුසුකම්

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුයි.
2. පැවරෙන කාර්යයන් අනුව දිවයිනේ කුමන ප්‍රදේශයක වුවද රාජකාරි ඉටු කිරීමට හැකි කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.
3. මනා චරිතයකින් යුක්ත විය යුතුයි.

## ගණකාධිකාරි

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පලපුරුද්දක් ලබා තිබීම.

උසස් ජාතික ගණකාධිකාරි ඩිප්ලෝමා පාඨමාලාව හදාරා තිබීම (HNDA) සහ අදාල විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය(SLICA), ශ්‍රී ලංකා සහතිකලත් කලමණාකරන ගණකාධිකරන ආයතනය( CMA), ශ්‍රී ලංකා වරලත් කළමණාකරන ගණකාධිකරන ආයතනය(CIMA), වරලත් සහතිකලත් ගණකාධිකාරි ආයතනය (ACCA) යන ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණයෙන් සමත් වීම හා අදාළ ක්ෂේත්‍රයේ වසරක පලපුරුද්දක් ලබා තිබීම.

වැටුප : සියළු දීමනා සහිතව මාසිකව රු.60,975.00 කි.

වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## සිවිල් පරිපාලන නිලධාරි

කළමණාකරනය, මානව සම්පත් කළමණාකරනය, පිරිස් පාලනය යන විෂයන්ට අදාලව විශ්ව විද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සහ වසරක පලපුරුද්දක් ලබා තිබීම.

වැටුප : සියළු දීමනා සහිතව මාසිකව රු.51,155.00 කි.

වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## භාෂා පරිවර්තක

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන විෂයන්ට අදාලව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම හෝ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන විෂයන්ට අදාලව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප : සියළු දීමනා සහිතව මාසිකව රු.45,770.00 කි.

වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## උපදේශන නිලධාරි

උපදේශනය/මනෝවිද්‍යාව පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් හා මාස 06 කට නොඅඩු පලපුරුද්දක් ලබා තිබීම හෝ පිළිගත් ආයතනයක උපදේශනය පිළිබඳව උසස් ඩිප්ලෝමාවක් සමඟ අදාල වෘත්තියෙහි වසර 05 ක පලපුරුද්දක් ලබා තිබීම හා සෞන්දර්ය සහ නාට්‍ය කලාව, සංගීතය, චිත්‍ර, මූර්ති ශිල්පය වැනි විෂයන්හි පාඨමාලාවන් හදාරා සහතික ලබා තිබීම සහ යෝග, භාවනා වැඩසටහන් සහ අනෙකුත් අධ්‍යාත්මික වැඩසටහන් පැවැත්වීමට ඇති හැකියාව.

වැටුප : සියළු දීමනා සහිතව මාසිකව රු.40,000.00 කි.

වයස : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## කළමණාකරන සහකාර - තාක්ෂණික (පරිගණක මෘදුකාංග, පරිගණක දෘඩාංග, ඡායාරූප/වීඩියෝ ශිල්පී, චිත්‍රාගාර/ශබ්ද ආලෝක පාලක, මුද්‍රණ ශිල්පී මාධ්‍ය)

එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාලව තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පස්වන (05)මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම හෝ එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාලව තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතරවන (04) මට්ටමේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සහ වසර 03ක පලපුරුද්දකින් යුක්ත වීම.

වැටුප : සියළු දීමනා සහිතව මාසිකව රු.38,110.00 කි.

වයස : අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන)

අපොස (සා/පෙළ) විභාගය

I. සිංහල/දෙමළ,
II. ගණිතය,
III. ඉංග්‍රීසි විෂය ඇතුළුව විෂයන් 04 කට සම්මාන සමාර්ථ සහිතව එකවර විෂයන් 06 කින් සමත්ව තිබීම.
IV. අපොස (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

වැටුප :සියළු දීමනා සහිතව මාසිකව රු.35,710.00 කි.

වයස :අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය - 2021.01.15

**පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය,**
**අංක 288/12 එල්,**
**රෝයල් ගාඩින්ස්,**
**ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**රාජගිරිය.**